සියලුම හිමිකම්ඇව්රිණි/All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 13 ශ්‍රේණිය
දෙවන වාර පරීක්ෂණය 2019 මාර්තු
கல்விப் பொதுத் தராதர(உயர்தரப்)பரீட்சை 2019 மார்ச் தரம் 13 இரண்டாம் தவணைப் பரீட்சை
General Certificate of Education(Adv.Level) Grade 13 Second Term Test 2019 March

භූගෝල විද්‍යාව - I Geography - I	22 S I	කාලය පැය තුනයි 03 hours

නම……………………………………………….. 13 ශ්‍රේණිය…………..

සැලකිය යුතුයි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. I කොටස බහුවරණ ප්‍රශ්න 40න් යුක්ත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යතු ය.

II කොටසෙහි ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතු ය. III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමසඳහා ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම් කොටසක් ද, ලෝක ආකෘති සිතියමක් ද සපයනු ලැබේ.

I කොටස

1. 1:50000 ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියමක දිග හා පළල පිළිවෙළින් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ
   1.කි.මී.40 x 25 2.කි.මී.10 x 20 3.කි.මී.100 x 10 4.කි.මී.80 x 40 5.කි.මී.25 x 40 (……)

2.1:50000 ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියමක හේන් ගොවිතැන දක්වා ඇති වර්ණය වන්නේ
   1.රතු 2.කහ 3.කොල 4.නිල් 5.දුඹුරු (……)

3.පහත දැක්වෙන A,B සහ C රූප සටහන් නිවැරදි අනු පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ



A



B



C

1.නෙරුව,උත්තල බෑවුම, අවතල බෑවුම 2.කපොල්ල,අවතල බෑවුම,ජල පෝෂක ප්‍රදේශය
3.නිම්නය,උත්තල බෑවුම,රැළි බිම 4.කපොල්ල,තැනිතලාව,දිය බෙත්ම
5.ආයතගාමී නිම්නය,කොත් කන්ද,අරීය ජලවහන රටාව (……)

4.දුරස්ථ සංවේද ක්‍රියාවලියේ දී භාවිතා කරන අභ්‍යාවකාශ වේදිකාවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ

1.අඛණ්ඩව නියමිත දින පරාසයක් තුළ පෘථිවියේ කිසියම් ස්ථානයක් නැවත නැවත ආවරණය කිරීම
2.දොඹකර හෝ කුළුනක් මත සවිකරන ලද සංවේද උපකරණ භාවිතය
3.අඩු පියාසර උසකින් ලබා ගැනීමේ හැකියාව සහ ඇල ගුවන් ඡායා රූප ලබා ගැනීමේ හැකියාව
4.වස්තු ප්‍රදීපනය කිරීම සඳහා ශක්ති මූලාශ්‍රයක් අවශ්‍ය නොවීම
5.අභ්‍යාවකාශ වේදිකා ලෙස අජටාකාශ මධ්‍යස්ථාන පමණක් භාවිතා කළ හැකි වීම (......)

5.භූගෝලීය තොරතුරු පද්ධතියක දත්ත සම්බන්ධයෙන් දක්වා ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි නොවන ප්‍රකාශය වන්නේ
1.අවකාශීය හා අවකාශිය නොවන දත්ත එකම පද්ධතියක් තුළ ගබඩා කිරීමේ හැකියාව
2.අවකාශීය දත්ත පමණක් සලකන විට එහි විශ්ලේෂණාත්මක හැකියාව සීමා වීම
3.අවකාශීය නොවන දත්ත පමණක් ගත් විට ව්‍යාප්තීන් සම්බන්ධ තොරතුරු සපයා ගැනීමේ හැකියාව සීමාකාරී වීම
4.භූගෝලීය තොරතුරු පද්ධතියක අඩංගු අවකාශීය දත්ත ගබාඩා කිරීමේ ආකෘති ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි වීම
5.දෛශික දත්ත ආකෘතිය යටතේ සකස් කෙරෙන සියලුම භූ ලක්ෂණ ලක්ෂ්‍ය , රේඛා වලින් පමණක් නිරූපණය කිරීම (......)

6.ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති ආශ්‍රිත තාක්ෂණය යටතේ ත්‍රිමාන තොරතුරු නිවැරදිව ලබා ගැනීම සඳහා අවම වශයෙන් සම්බන්ධ විය යුතු චන්ද්‍රිකා සංඛ්‍යාව

1. 4 කි 2. 6 කි 3. 5 කි 4. 8 කි 5.12 කි (......)

7.වාර විභාගයක දී යම් විෂයකට සිසුන් විසින් ලබා ගන්නා ලද ලකුණු හැඳින්විය හැක්කේ

1.ද්විතීයික දත්ත වශයෙනි 2.සන්තතික දත්ත වශයෙනි 3.විවික්ත දත්ත වශයෙනි
4.සමූහිත දත්ත වශයෙනි 5.අසමූහිත දත්ත වශයෙනි (......)

8.උෂ්ණත්වය,වර්ෂාපතනය සහ උන්නතාංශය වැනි දත්ත ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි ප්‍රාථමික දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදය වන්නේ

1.සමීක්ෂණ 2.ප්‍රශ්නාවලි 3.සම්මුඛ සාකච්ඡා 4.මිනුම්
5.නිරීක්ෂණ (......)

9.සමුච්චිත සංඛ්‍යාත ව්‍යාප්තියක හඳුනාගත හැකි සුවිශේෂිතම ලක්ෂණයක් වන්නේ
1.කිසියම් විචල්‍යයක කිසියම් අගයකින් ඉහළ හෝ පහළ සංඛ්‍යාතය කුමක්දැයි හඳුනාගත හැකි වීම
2.දත්ත ව්‍යාප්තියක කේන්ද්‍රික අගයේ සිට විසිරී ඇති ආකාරය පිළිබඳව හඳුනාගතහැකි වීම
3.මෙය දත්ත ව්‍යාප්තියක් සාරාංශ කර දක්වන මිනුමක් ලෙස හැඳින්විය හැකි වීම
4.මෙවැනි සංඛ්‍යාත ව්‍යාප්තියක මුළු දත්ත ප්‍රමාණයෙන් 50% ක් පමණ නියෝජනය කරයි
5.වඩාත් පොදු අගය අවශ්‍ය වූ විට සමුච්චිත සංඛ්‍යාතය යොදා ගැනීම පහසු වීම (......)

10.දත්ත සමූහයක මධ්‍යන්‍යයේ සිට එකනෙක අගයන් විචලනය වන ආකාරය දැක්වීම සඳහා වඩාත් යෝග්‍යතම ප්‍රස්තාරික ක්‍රමවේදය වන්නේ

1.අපගමන ප්‍රස්තාරය 2.ද්විත්ව තීරු ප්‍රස්තාරය 3.සරල රේඛා ප්‍රස්තාරය
4.පිරමීඩාකාර ප්‍රස්තාරය 5.බහු තීරු ප්‍රස්තාරය (......)

11.භූගෝල විද්‍යා විෂයය ක්ෂේත්‍රයෙහි මුඛ්‍ය පරමාර්ථය නිවැරදිව දක්වා ඇති පිළිතුරු වන්නේ
1.භෞතික හා මානව භූ දර්ශනයන් වෙන් වෙන් ව අධ්‍යයනය කිරීමයි
2.භෞතික භූ දර්ශනය පමණක් සාකල්‍ය ප්‍රවේශයකින් අධ්‍යයනය කිරිමයි
3.මානුෂ භූ දර්ශනය පමණක් සාකල්‍ය ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමයි
4.භෞතික ප්‍රපංච අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව අධ්‍යයනය කිරීමයි
5.භෞතික හා මානුෂ භූ දර්ශනය වෙන් වෙන්ව අධ්‍යයනය කිරීම වෙනුවට එහි සබඳතා එක්ව අධ්‍යයනය කිරීමයි (......)

12.පහත දක්වා ඇත්තේ ගෝලීය බියෝමයක සුවිශේෂී ලක්ෂණ කිහිපයකි.එම ලක්ෂණ හඳුනාගතහැකි බියෝමය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ
1.දිගු වියළි ඍතුවක් සහ කෙටි වර්ෂා කාලයක් ඇත
2.වර්ෂාපතනය මි.මී.250 - මි.මී.750 ත් අතර වේ.
3.ආර්ද්‍රතාව අඩු මට්ටමක පවතී
1.නිවර්තන මෝසම් වන්නාන්තර බියෝමය 2.සෞම්‍ය කලාපීය වනාන්තර
3.සෞම්‍යකලාපික තෘණ භූමි 4.නිවර්තන කලාපික තෘණ භූමි
5.කාන්තාර (......)

13.පරිවර්තීගෝලය තුළ සිදුවන පතන සීඝ්‍රතා සංසිද්ධියට හේතුව දක්වා ඇති පිළිතුර වන්නේ
1.භූ තලයේ සිට ගමන් කරන භූ විකිරණවල තීව්‍රතාවය ඉහළ යත් ම ක්ෂය වී යන බැවිනි
2.පරිවර්තී ගෝලය තුළ ඉහළ යත්ම පීඩන අනුක්‍රමණයෙහි වෙනසක් සිදුවන බැවිනි
3.පරිවර්තී ගෝලයේ ඉහළ සීමාවේදී සූර්ය විකිරණ අවශෝෂණය වේගවත්ව සිදුවන බැවිනි
4.අපරිවර්තී ගෝලයේ දී සිදුවන අධෝරක්ත කිරණ අවශෝෂණය හේතුවෙනි
5.සියලු කාලගුණික හා දේශගුණික සංසිද්ධීන් පරිවර්තී ගෝලයට සිමා වන බැවිනි (......)

14.පහත දක්වා ඇති ඒවා අතුරින් ශිලාගෝලයේ උප පද්ධතියක් ලෙස සැලකිය නොහැක්කේ
1.මහාද්වීපික ස්කන්ධ 2.සාගර පතුල් 3.පාෂාණ
4.පස 5.වායු ස්කන්ධ (......)

15.ගෝලීය ජල ව්‍යාප්තිය අනුව භූගතව ව්‍යාප්තව ඇති ජල ප්‍රතිශතය වනුයේ
1. 79% 2. 20% 3. 1% 4. 38% 5. 52% (......)

16.ආම්ලික ආග්නේය පාෂාණවල සිලිකා සංයුතිය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ
1.සිලිකා ප්‍රතිශතය 65% ට වැඩි යකඩ ප්‍රතිශතය 20% 25% ත් අතර
2.සිලිකා ප්‍රතිශතය 55%ට අඩුය යකඩ ප්‍රතිශතය 45%
3.සිලිකා ප්‍රතිශතය 65% - 55% යකඩ ප්‍රතිශතය 45% ට අඩු
4.සිලිකා ප්‍රතිශතය 45%ට අඩුය යකඩ ප්‍රතිශතය 50%ට වැඩිය
5.සිලිකා ප්‍රතිශතය 65%ට අඩුය යකඩ ප්‍රතිශතය 30%ට වැඩිය (......)

17.තාප සංවහන ධාරා ජනනය වීම වාර්තා වන පෘථිවි අභ්‍යන්තර ස්ථරය වනුයේ
1.කබොල 2.ඉහළ ප්‍රාවරණය 3.අධෝගෝලය 4.පහළ ප්‍රාවරණය
5.අභ්‍යන්තර හරය (......)

18.බහුවිධ උපද්‍රවයක් මෙන් ම නිශ්චිත කලාපවල සිදුවන උපද්‍රවයක් දක්වා ඇති පිළිතුර වන්නේ
1.භූමිකම්පා 2.සුනාමි 3.සුළිසුළං 4.අකුණු සැර 5.ජල ගැලීම් (......)

19.යමකම ක්‍රියාවලිය සඳහා බලපාන සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ

1.උෂ්ණත්වය,පීඩනය,විවර හා කුස්තුර,කාලය

2.උෂ්ණත්වය,පීඩනය,ඛනිජ සංයුතිය,කාලය

3.වායු ස්කන්ධ,පීඩනය,ඛනිජ සංයුතිය,සූර්ය විකිරණ

4.පීඩනය.විවර හා කුස්තුර,ජෛවීය ක්‍රියා,උෂ්ණත්වය

5.මැග්මා.විවර හා කුස්තුර,භූ චලන,උෂ්ණත්වය (……)

20.පහත දක්වා ඇති භූ රූප අතුරින් ගලන ජලය හේතුකොටගෙන බාදිත හා නිධි සාධිත අවස්ථාවන්හී දී පමණක් නිර්මාණය වන භූ රූප යුගලය පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ

1.දොරු හා ගල් වන 2.නෙත්ති නෙරු සහ දුනු විල් 3.හැඩපලු ගංගා සහ ඩෙල්ටා

4.පිටාර තැන්න සහ ගං දගර 5.ගං කණ්ඩි සහ ගං මළු (……)

21.මහාද්වීපික ග්ලැසියර් සම්බන්ධයෙන් දක්වා ඇති නිවැරදි ප්‍රකාශයක් **නොවන්නේ**

1.මහාද්වීපික ග්ලැසියර් යනු ධ්‍රැවාසන්න ප්‍රදේශවල නිර්මාණය වී ඇති අයිස් යායවල් ය.

2.පෘථිවියේ ග්ලැසියර්වලින් 96%ක් ම දක්නට ලැබෙන්නේ ධ්‍රැවාසන්න කලාපවල ය.

3.ලොව විශාලතම මහාද්වීපික ග්ලැසියරය දකුණු අර්ධගෝලයේ ඇන්ටාර්ක්ටිකාවයි.

4.ඩ්‍රම්ලින,කේම,අගම්ගල් මහාද්වීපික ග්ලැසියර් නිධිසාධනය වීම හේතුකොටගෙන නිර්මාණය වූ භූ රූප වේ.

5.සර්ක,අරේට,ලම්බ නිම්න මහාද්වීපික ග්ලැසියර් ඛාදනය හේතුකොටගෙන නිර්මාණය වන භූ රූප වේ. (……)

22.වැඩිම ඇල්බීඩෝවක් සහිත පෘෂ්ඨය ලෙස සැලකිය හැක්කේ

1.ගොඩබිම 2.ජලය 3.හිම 4.තෘණ 5.පාෂාණ (……)

23.ගෝලීය දේශගුණ වෙනස්වීම් කෙරෙහි බලපාන ස්වභාවික සාධකයක් සහ මානව සාධකයක් පිළිවෙළින් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1.ස්වභාවික හරිතාගාර ආවරණ ක්‍රියාවලිය සහ හිරු ලප

2.සාගර මතුපිට ඇතිවන උෂ්ණත්ව වෙනස්කම් සහ යමහල්

3.හිරු ලප ක්‍රියාකාරීත්වය සහ කාර්මික අපද්‍රව්‍ය

4.කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය සහ න්‍යෂ්ඨික අත්හදා බැලීම්

5.පොසිල ඉන්ධන දහනය සහ වන හරණය (……)

24.ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලාශ වලට යට වී ඇති බිම් ප්‍රමාණයෙන් වැඩිම බිම් ප්‍රමාණයක් අයත් වන පළාත වන්නේ

1.දකුණු පළාත 2.මධ්‍යම පළාත 3.උතුරු පළාත 4.උතුරු මැද පළාත

5.සබරගමුව පළාත

(……)

25.ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 3/5ක ප්‍රදේශයක ව්‍යාප්තව ඇති ස්වභාවික වෘක්ෂලතා විශේෂය වන්නේ

1.වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර 2.නිවර්තන වර්ෂා වනාන්තර 3.කඩොලාන

4.සැවනා 5.කඳුකර වනාන්තර (……)

26.සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ඉහළ ම උපත් අනුපාතිකය වාර්තාවන රට ලෙස සැලකෙන්නේ

1.නයිජීරියාව 2.මාලි 3.උගන්ඩා 4. සැම්බියා 5.බර්කිනා ෆාසෝ (……)

27.ලෝක ජන සංඛ්‍යා වර්ධනය සම්බන්ධයෙන් දක්වා ඇති නිවැරදි ප්‍රකාශය වන්නේ

1.ක්‍රි.ව.1800 දී පපමණ බිලියන 1ක් වූ ලෝක ජන සංඛ්‍යාව ක්‍රි.ව.2011 අවසාන භාගය වන විට බිලියන 9 තෙක් වර්ධනය වී තිබේ.

2.ලෝක ජන සංඛ්‍යාව වර්ධනය වීමේ දී බිලියනයෙන් බිලියනය වර්ධනය වීමට ගත වූ කාලය ක්‍රම ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී.

3.ක්‍රි.ව.1950 න් පසු කාලපරිච්ඡේදය තුළ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජන සංඛ්‍යා වර්ධනයේ මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කරයි.

4.සංවර්ධිත රටවල ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන්නේ මෑත කාලයේ සිදුවන සීඝ්‍ර නාගරීකරණයත් සමගය.

5.ලෝක ජන සංඛ්‍යාව බිලියන 1 සිට 2 දක්වා වර්ධනය විමට වසර 123 ක් ගත වී ඇති අතර බිලියන 2 සිට 3 දක්වා වර්ධනය වීමට ගතව ඇත්තේ වසර 32ක් පමණි. (……)

28.ලෝක ජන සංඛ්‍යා ප්‍රක්ෂේපණයන්ට අනුව වසර 2050 වන විට අධික ජන සංඛ්‍යාවක් ජීවත් වන රටවල් හතර පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ

1.චිනය,ඉන්දියාව,ඇ.එ.ජ.ඉන්දුනීසියාව
2.ඉන්දියාව,චීනය,බ්‍රසීලය,පාකිස්ථානය
3.චීනය,ඇ.එ.ජ.නයිජීරියාව,ඉන්දුනීසියාව
4.ඉන්දියාව,චීනය,ඇ.එ.ජ.,නයිජීරියාව
4.ඉන්දියාව,ඇ.එ.ජ.,ඉන්දුනීසියාව,නයිජීරියාව (……)

29.ලෝක බැංකු දත්තවලට අනුව වසර 2015 පමණ වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන ජන සංඛ්‍යාවෙන් වැඩි පිරිසක් වාර්තා වී ඇත්තේ

1.දකුණු ඇමරිකානු කලාපයෙනි
2.අප්‍රිකානු කලාපයෙනි
3.දකුණු ආසියානු කලාපයෙනි
4.අග්නිදිග අසියාතික කලාපයෙනි
5.මධ්‍යම ආසියාතික කලාපයෙනි (……)

30.ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනයේ අවකාශීය ව්‍යාප්තිය අනුව වර්ධන සීඝ්‍රතාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ

1.බස්නාහිර පළාත තුළ ජන සංඛ්‍යාවේ ඉහළ වර්ධන සීඝ්‍රතාවයක් පැවතීම.
2.තෙත් කලාපීය දිස්ත්‍රික්කවල ඉහළ වර්ධන සීඝ්‍රතාවක් පැවතීම
3.තෙත් කලාපීය දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යා වර්ධන සීඝ්‍රතාවයට වඩා වියළි කලාපීය දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යා වර්ධන සීඝ්‍රතාව ඉහළ මට්ටමක පවතී.
4.දකුණු හා ඌව පළාත්වල ජන සංඛ්‍යා වර්ධන සීඝ්‍රතාව සමාන මට්ටමකින් සිදු වේ.
5.උතුරු හා උතුරු මැද පළාත්වල ජන සංඛ්‍යා වර්ධන සීඝ්‍රතාව දිගින් දිගටම ස්ථාවර මට්ටමක පවතී (……)

31.නාගරීකරණය හේතුවෙන් ඇතිවන ඍණාත්මක ප්‍රතිඵලයක් සහ සාධනීය ප්‍රතිඵලයක් පමණක් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ

A අධ්‍යාපන කටයුතුවල ව්‍යාප්තිය
B අවිධිමත් සංස්කෘතික ලක්ෂණවල ව්‍යාප්තිය
C සමාජ විරෝධී ක්‍රියාවන්ගේ ව්‍යාප්තිය
D ආර්ථික හා වාණිජ කටයුතුවල ව්‍යාප්තිය
E රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල ව්‍යාප්තිය

1.AE 2.DB 3.BC 4.AB 5.BA (……)

32.ශ්‍රී ලංකාවේ කොළඹ නගරය තුළ සිදුවන නාගරීකරණය හේතුවෙන් මතු වී ඇති අපද්‍රව්‍ය ගැටලුව විසඳීම සඳහා කසල තටාකාංගනයක් ඉදි කිරීමට යෝජිත ප්‍රදේශය වනුයේ

1.පුත්තලම දිස්ත්‍රික්කයේ නොරච්චෝලෙ ප්‍රදේශය 2.පුත්තලම දිස්ත්‍රික්කයේ අරුවක්කාලු ප්‍රදේශය
3.කොළඹ දිස්ත්‍රික්කයේ හෝකන්දර ප්‍රදේශය 4.කලුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රදේශය
5.ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රදේශය (……)

33.ශ්‍රී ලංකාවේ 2012 වසර වන විට මුළු ජනගහනයෙන් නාගරික ජන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස දක් වූ විට නිවැරදි පිළිතුර වන්නේ

1.15.7% 2.17.6% 3.11.8% 4.18.2% 5.21.8% (……)

34.හරිත විප්ලවය ආශ්‍රිත කෘෂිකාර්මික තාක්ෂණය ක්‍රියාත්මක වූ අංශ දෙක නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

A ජාන තාක්ෂණය B ඓන්ද්‍රීය කෘෂිකර්මය
C නව මාදිලියේ වැඩි ඵලදායී බීජ වර්ග නිපදවීම D දෙමුහුන් කල බීජ භාවිතය
E නවීන තාක්ෂණික ශිල්පක්‍රම කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගැනීම

1.CE 2.DB 3.BC 4.AB 5.BE (……)

35.ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය කෙරෙහි හරිත විප්ලවයෙහි බලපෑම දක්නට ලැබෙන්නේ

1.1960 දශකයේ මුල් භාගයේ දීය 2.1960 දශකයේ මැද භාගයේ දි ය
3.1960 දශකයේ අග භාගයේ දීය 4.1970 දශකයේ මුල් භාගයේ දි ය
4.1970 දශකයේ අග භාගයේ දීය (……)

36.ලෝකයේ පෙට්‍රෝලියම් සංචිත ව්‍යාප්තව ඇති දකුණු ඇමරිකානු රටක් සහ අප්‍රිකානු රටක් පිළිවෙළින් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1.වෙනිසියුලාව හා ලිබියාව 2.කසකස්ථානය හා නයිජීරියාව 3.ලිබියාව සහ නයිජීරියාව
4.ආර්ජනටිනාව සහ ගිනිබිසව් 5.ලිබියාව සහ චිලී (……)

37.ටයිටේනියම් ලෝහය නිස්සාරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ යොදාගනු ලබන ඛනිජ සම්පත වනුයේ

1.මයිකා 2'ñkrk 3.ඇපටයිට් 4.හුණුගල් 5.ඛනිජ වැලි (……)

38.කර්මාන්ත ස්ථානගත වීමේ මෑත කාලීන ප්‍රවණතාවක් ලෙස සැලකිය හැක්කේ

1.පෞද්ගලික ව්‍යවසායකයින් කර්මාන්ත ආරම්භ කිරීම
2.කර්මාන්ත ස්ථානගත වීමේ දී රාජ්‍ය ප්‍රතිපත්ති මූලිකත්වය ගැනීම
3.බහු ජාතික සමාගම්වල තීරණ කර්මාන්ත ස්ථානගතවීමේ දී වඩාත් වැදගත්වීම
4.නිදහස්ව ස්ථානගතවිය හැකි කර්මාන්ත වර්ධනය අඩපණ වීම
5.කර්මාන්ත ස්ථානගත කිරීමෙහිලා ගෝලීයකරණ ක්‍රියාවලියෙහි බලපෑම සීමාකාරී වීම (……)

39.ශ්‍රී ලංකාවේ අමුද්‍රව්‍ය මත ස්ථානගත වූ කර්මාන්තයක් ලෙස සැල කිය හැක්කේ

1.සිමෙන්ති කර්මාන්තය 2.අගලුම් කර්මාන්තය 3.රබර් හා ප්ලාස්ටික් කර්මාන්තය
4.හස්ත කර්මාන්තය 5. ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත (……)

40.ආසියා පැසිෆික් කලාපයේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සඳහා පිහිටුවා ඇති පැසිෆික් ආසියා සංචාරක සංගමයේ මූලස්ථානය පිහටා ඇත්තේ

1.හොනලුලු 2.ජකර්තා 3.නේපිඩෝව 4.රංගුන් 5.යොකොහොමා (……)

II කොටස

1.ශ්‍රී ලංකා මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන ලද 1:50000 පරිමාණයේ මහියංගන භූ ලක්ෂණ සිතියමේ කොටසක් ඔබට සපයා ඇත.එහි සමෝච්ඡ රේඛා අන්තරය මීටර් 20කි.එම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

(i) සිතියමේ A-B සහ C-D රේඛාවලින් දැක්වෙන භූ ලක්ෂණ දෙක නම් කරන්න (ලකුණු 02යි)

(ii) සිතියමේ අංක 1 හා 2 ලෙස දක්වා ඇති සංස්කෘතික ලක්ෂණ දෙක හඳුනාගෙන නම් කරන්න (ලකුණු 02යි)

(iii)සිතියමේ අංක 3 චතුරස්‍රය තුළ දක්නට ලැබෙන රාජ්‍ය ආයතන දෙකක් නම් කරන්න (ලකුණු 02යි)

(iv)P ලෙස නම් කර ඇති වැව 1:25000 පරිමාණයට ඇඳ එයට අදාළ රේඛීය පරිමාණය ද ඇඳ දක්වන්න (ලකුණු 03යි)

(v) a.සිතියම්ගත ප්‍රදේශය හරහා දිවෙන B 808 ශ්‍රේණියේ ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන අප්‍රධාන මාර්ග සංඛ්‍යාව කොමණ ද?

b.සිතියම්ගත ප්‍රදේශයේ දක්නට ලැබෙන නාගදීප මහ වැවට අයත් වන ජල පෝෂක ප්‍රදේශය සිතියම්ගත ප්‍රදේශයේ කවර කර්තුවකට අයත් වේ ද ?

c.සිතියම්ගත ප්‍රදේශය පුරා ව්‍යාප්තව ඇති වෘක්ෂලතා ප්‍රභේදය නම් කරන්න (ලකුණු 03යි)

(vi)සිතියම්ගත ප්‍රදේශයේ වී වගාව සාර්ථකව කරගෙන යෑම සඳහා බලපා ඇති භෞතික සාධක එකක් සහ මානව සාධක එකක් විස්තර කරන්න (ලකුණු 04යි)

(vii)සිතියම්ගත ප්‍රදේශයේ නැගෙනහිර අර්ධයේ දක්නට ලැබෙන හේන් ගොවිතැන තවදුරටත් ව්‍යාප්ත කළහොත් ඇතිවිය හැකි පාරිසරික උපද්‍රව දෙකක් විස්තර කරන්න (ලකුණු 04යි)

2.ඔබ වෙත සපයා ඇති ලෝක ආකාති සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න සම්මත හා නිවැරදි ක්‍රම ද වර්ණ ද භාවිතා කිරීමට සැලකිලිමත් වන්න.

(i) මොංගෝලියානු සානුව
(ii) නයිජර් ගංගාව
(iii) නල්ලබාර් තැන්න
(iv) ගෝබී කාන්තාරය
(v) ටිමෝර් මුහුද
(vi) ඉන්දියන් සාගරයේ පිහිටි ප්‍රංශයට අයත් රීයුනියන් දූපත
(vii) ග්‍රිනිච් මධ්‍ය දේශාංශය
(viii) කොකොස් භූ තැටිය
(ix) ලෝකයේ ජනාධික රටවල් අතර සිව්වන ස්ථානය ගනු ලබන අග්නිදිග ආසියාතික රට
(x) 1943 දී හරිත විප්ලවය ආරම්භ වූ රට (ලකුණු 10යි)

III කොටස

3 ප්‍රශ්නයේ (ii) කොටසට පිළිතුරු සැපයීම සඳහා සපයා ඇති ශ්‍රී ලංකා සිතියම භාවිතා කරන්න

3.(i) සේයා සිතියම් මගින් ඉදිරිපත් කළ හැකි විචල්‍යයන් දෙකක් නම් කරන්න (ලකුණු 02යි)

(ii)ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතයමෙහි පහත දී ඇති සම වර්ෂා රේඛාවන් විහිදී යන ආකාරය නිවැරදිව ඇඳ දක්වන්න

(සම්මත වර්ණය භාවිතා කළ යුතු අතර වර්ෂාපතන අගය නිවැරදිව දැක්විය යුතු ය)

1.මි.මී. 1250 සමවර්ෂා රේඛාව
2.මි.මී. 2000 සමවර්ෂා රේඛාව
3.මි.මී. 6000 සමවර්ෂා රේඛාව (ලකුණු 03යි)

(iii)තිත් සිතියමක් මගින් කිසියම් විචල්‍යයක් නිරූපණය කිරීමේ දී දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකක් සහ දුර්වලතා දෙකක් විස්තර කරන්න (ලකුණු 04යි)

(iv)භූ ලක්ෂණ සිතියම් භාවිතයේ දී සිතියම් පරිශීලකයෙකුට කිසියම් සිතියම්ගත ප්‍රදේශයක කවර ක්ෂෙත්‍රයන් පිළිබඳව අවබෝධයක් ලබා ගතහැකි ද යන්න සාකච්ඡා කරන්න (ලකුණු 06යි)

04. (i) කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් දෙකක් සඳහන් කරන්න (ලකුණු 02යි)

(ii)පහත අංක 01 වගුවෙහි දැක්වෙන වර්ෂ 2000 සිට 2015 දක්වා වව්නියාවේ වර්ෂාපතන දත්ත පදනම් කර ගනිමින් පහත දැක්වෙන දෑ ගණනය කරන්න

1.සංඛ්‍යාතය
2.සමුච්චිත සංඛ්‍යාතය
3.සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය

වගු අංක 01

වව්නියාවේ වාර්ෂික වර්ෂාපතනය 2003 - 2018 මි.මී.

වර්ෂය	වර්ෂාපතනය	වර්ෂය	වර්ෂාපතනය
2003	275	2011	110
2004	99	2012	110
2005	55	2013	176
2006	143	2014	121
2007	121	2015	231
2008	77	2016	88
2009	88	2017	220
2010	154	2018	132

මූලාශ්‍රයඃ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (ලකුණු 06යි)

(iii)ඔබ ගණනය කළ අගයන් භාවිතා කරමින් සමුච්චිත ප්‍රතිශත වක්‍රය නිර්මාණය කරන්න (ලකුණු 05යි)

(iv) ඔබ නිර්මාණය කළ සමුච්චිත ප්‍රතිශත වක්‍රය ඇසුරින් වව්නියාවේ වාර්ෂික වර්ෂාපතනයෙහි වෙනස්කම් පරීක්ෂා කරන්න (ලකුණු 02යි)

5.පහත ප්‍රස්තාර සටහනින් දැක්වෙන්නේ සමස්ථ ශ්‍රී ලංකාවේ සහ එක් එක් පළාත් අනුව සේවා වියුක්ති ප්‍රතිශතයයි.එහි දැක්වෙන තොරතුරු පදනම් කරගෙන පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න



(i) මෙම ප්‍රස්තාර ක්‍රමය නම් කරන්න (ලකුණු 02යි)

(ii) මෙම ප්‍රස්තාරයෙන් දැක්වෙන ශ්‍රී ලංකාවේ සහ පළාත් අනුව සේවා වියුක්තියේ සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න (ලකුණු 04යි)

(iii) සිතියම් විද්‍යාත්මක ක්‍රමයක් වශයෙන් මෙම ප්‍රස්තාර ක්‍රමයේ ප්‍රයෝජන දෙකක් සාකච්ඡා කරන්න (ලකුණු 04යි)

(iv) සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදයක් වශයෙන් ජනවිද්‍යාත්මක විචල්‍යයන් ඉදිරිපත් කිරීමේ දී පිරමීඩාකාර ප්‍රස්තාර ක්‍රමවේදයෙහි සුවිශේෂතා විස්තර කරන්න (ලකුණු 05යි)

06. (i) දුරස්ථ සංවේද තාක්ෂණයේ දී අභ්‍යාවකාශ වේදිකා ලෙස භාවිතා කරන යානා දෙකක් නම් කරන්න (ලකුණු 02යි)

(ii) ගෝලීය තොරතුරු පද්ධතියක් තුළ භාවිතා කෙරෙන ක්‍රමවේදයක් ලෙස සිතියම් තල රූප සටහනක් අධාර කර ගනිමින් පැහැදිලි කරන්න (ලකුණු 04යි)

(iii) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියක මූලික උපාංග දළ රූප සටහනක් අධාරයෙන් පැහැදිලි කරන්න (ලකුණු 04යි)

(iv) ආපදා කළමණාකරණයේ දී සහ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදයන්හි දායකත්වය සාකච්ඡා කරන්න (ලකුණු 05යි)

13 Nf .d, h I

II කොටසෙහි ප්‍රශ්න අංක 2 ට අදාළ ලෝක සිතියම

III කොටසෙහි ප්‍රශ්න අංක 3 - (ii) ට අදාළ ශ්‍රී ලංකා සිතියම

The National e-learning Portal for The General Education